## අරගලය පිළිබඳ සමීක්ෂණයේ සොයා ගැනීම්හි සාරාංශය - සැප්තැම්බර් 2022

## විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - සෝෂල් ඉන්ඩිකේටර්

**හැඳින්වීම**

ශ්‍රී ලංකාව නිදහසින් පසු ඉතිහාසයේ දරුණුතම ආර්ථික හා දේශපාලන අර්බුදයෙන් ගොඩ ඒමට වෙර දරමින් සිටී. නිදහසින් පසු රට පාලනය කළ අනුප්‍රාප්තික ආණ්ඩුවල අනුවණ ආර්ථික ප්‍රතිපත්ති, 2006 සිට රාජපක්ෂ පාලනයේ මහා පරිමාණ දූෂණ සහ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ අතිශය ගැටලු සහගත ආර්ථික තීරණ වැනි දේවල් නිසා 2022 අප්‍රේල් මාසයේදී රට ණය වාරික ගෙවීම පැහැර හැරීමේ තත්වයට පත් විය. විදේශ සංචිත හිඟකම හේතුවෙන් ඉන්ධන, ගෑස්, පොහොර, ඖෂධ ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය රැසක් ආනයනය කිරීම සීමා වී තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස බරපතළ හිඟයක් රට තුළ ඇතිව තිබේ. රටේ කනගාටුදායක තත්ත්වය පිළිබඳ රටපුරා විසිරුණු මහජන කෝපය මැද අර්බුධයට, ප්‍රධාන වශයෙන් වගකිව යුතු ගෝඨාභය රාජපක්ෂ රජය ඉල්ලා අස්වීම ඇතුළු 'පාලන ක්‍රමයේ වෙනසක්' (සිස්ටම් චේන්ජ්) ඉල්ලා ජනතාව පාරට බැස්සේය. දේශපාලන පක්ෂ භේදයකින් තොරව තරුණ තරුණියන්ගේ විරෝධතා ව්‍යාපාර රැල්ලෙන් එල්ල වූ පීඩනය මත, රටින් පැන ගිය ගෝඨාභය රාජපක්ෂ ජුලි 14 වැනිදා සිය ඉල්ලා අස්වීම භාර දුන්නේය. පුරප්පාඩු වූ ජනාධිපති ධූරය සඳහා පාර්ලිමේන්තුව විසින් අගෝස්තු 20 වැනිදා රනිල් වික්‍රමසිංහ තෝරා පත් කර ගන්නා ලදී. රටේ අටවැනි විධායක ජනාධිපතිවරයා ලෙස බලයට පත් වූ දා සිට, වික්‍රමසිංහ සිය පාර්ලිමේන්තු සහය තහවුරු කර ගැනීමට අමතරව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ණයහිමියන් සමග සාකච්ඡා කිරීමට ප්‍රමුඛත්වය දුන්නේය. ඔහු විරෝධතාකරුවන්ගේ ඉල්ලීම් දුර්වල කිරීමට සහ රටේ දේශපාලන ක්‍රමයේ වෙනසක් ඉල්ලා සිටින තරුණයින් මර්දනය කිරීම සඳහා යොදා ගත හැකි සියලුම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන යොදවයි. මෙම පසුබිම තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් විසින් විරෝධතාකරුවන් සහ ඔවුන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් මහජන ආකල්ප ග්‍රහණය කර ගැනීම සඳහා දීප ව්‍යාප්ත සමීක්ෂණයකට අවතීර්ණ විය.

**ක්‍රමවේදය**

ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරෙන් (සිංහල, දෙමළ, උඩරට දෙමළ, සහ මුස්ලිම්) නියැදි ප්‍රතිචාර දැක්වූවන් 1000 ගෙන් අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා කර අරගලය පිළිබඳ අධ්‍යයනය සිදු කරන ලදී. නියැදිය සියලුම දිස්ත්‍රික්ක 25 තුළ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල ස්ත්‍රීන් සහ පුරුෂයන්ගෙන් සමන්විත විය. ප්‍රතිචාර දැක්වූවන් තෝරාගැනීමට අහඹු නියැදීමේ ක්‍රමවේදය භාවිතා කර ඇති අතර, නියැදි ස්ථාන තෝරා ගැනීම සඳහා බහුඅදියර අහඹු ස්ථරීකරණ නියැදි තාක්ෂණය භාවිතා කරන ලදී. මෙම ජාතික මත විමසීම සඳහා ක්ෂේත්‍ර කටයුතු 2022 සැප්තැම්බර් 22 සිට ඔක්තෝම්බර් 12 දක්වා පවත්වන ලදී. ජනගහනයේ දිස්ත්‍රික්කය සහ ජනවාර්ගික සැබෑ අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තබා ඇත. සමාජ විද්‍යාව සඳහා සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් දත්ත කට්ටලය විශ්ලේෂණය කරන ලදී.

## සොයාගැනීම්

### *ආදායම් සහ වියදම්*




ඔක්තෝම්බර් මාසයේ දී කරන ලද සමීක්ෂණ සොයාගැනීම්වලට අනුව, ශ්‍රී ලාංකිකයන්ගේ ආර්ථික අපහසුතා තවදුරටත් පවතී. සැලකිය යුතු බහුතරයක් (82%ක් පමණ) පවසන්නේ තමන් ජීවත් වන්නේ දුෂ්කරතා මැද බවත් ඔවුන්ගේ ආදායමෙන් ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි බවත්ය. ඔවුන්ගෙන් අඩක් (46%) පවසා සිටින්නේ තමන් ජීවත් වන්නේ දැඩි දුෂ්කරතා මැද බවයි. කෙසේ වෙතත්, 19% ක් පවසන්නේ මෙම ආර්ථික හා දේශපාලන වියවුල් මධ්‍යයේ තම ආර්ථික තත්ත්වය සාමාන්‍ය බවයි. ප්‍රාදේශීය වශයෙන් ගත් කල, නගර සහා බල ප්‍රදේශයෙන් පිටත ජීවත් වන ජනතාව අතර මෙම දුෂ්කරතා සාපේක්ෂව වැඩිය.

### *අරගලය පිළිබඳ ආකල්ප*




අරගල ව්‍යාපාරය සහ ඊට සම්බන්ධ වූවන් දුර්වල කිරීමේ රජයේ අඛණ්ඩ ක්‍රියාවලිය තුළ, අරගලය පිළිබඳ මහජන මතය සහ අරගලයට එල්ල වී ඇති චෝදනා පිළිබඳව ද සමීක්ෂණය මගින් විමසා බැලීය. තවමත් ශ්‍රී ලාංකිකයන්ගෙන් අති බහුතරයක් අරගලය පිළිබඳ ධනාත්මක අදහස් ප්‍රකාශ කරන බව එයින් පෙන්නුම් කෙරේ. ජාතික මට්ටමින් 82%ක් අරගලය රට තුළ ධනාත්මක බලපෑමක් ඇති කළ බව විශ්වාස කරන අතර ඊට සමාන ප්‍රතිශතයක් අරගලය ඒ මොහොතේ අවශ්‍යතාවයක් බව විශ්වාස කරයි. ශ්‍රී ලාංකිකයින්ගෙන් 42%ක් අරගලයේ නිරත වූ තරුණ තරුණියන්ට එරෙහිව ගන්නා නීතිමය ක්‍රියාමාර්ග හෙළා දකියි. කෙසේ වෙතත් විරෝධතාකරුවන් නීතිය උල්ලංඝණය කර ඇත්නම් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බවට 58%කගේ එකඟත්වයක් තිබේ. තවද, වයස් කාණ්ඩ අනුව, තරුණ තරුණියන් (අවුරුදු 30 ට අඩු) අතර අරගලයට ලැබෙන සහය තරමක් වැඩි බව සමීක්ෂණය පෙන්වා දෙයි.

***පාලන ක්‍රමයේ සිදු විය හැකි වෙනසක් පිළිබඳ මහජන මතය***




ශ්‍රී ලංකාවේ 8 වැනි විධායක ජනාධිපතිවරයා ලෙස රනිල් වික්‍රමසිංහ මහතා පත්කිරීමෙන් රටේ දේශපාලනය බොහෝ දුරට සාමාන්‍ය තත්ත්වයට පත්වුව ද රටේ දේශපාලන ක්‍රමයේ වෙනසක් සඳහා වූ ඉල්ලීම ජනතාව අත්හැර නැති බව සමීක්ෂණවලින් හෙළිදරව් වේ. සැලකිය යුතු ප්‍රතිශතයක් (82%) ප්‍රකාශ කරන්නේ රට පාලනය කරන ආකාරය වෙනස් කිරීමට ඔවුන් සහාය දෙන බවයි. එසේ විශ්වාස කරන්නේ වැඩි වශයෙන් තරුණ තරුණියන් බව පැහැදිලිය.

***පාලනය වන විදියේ වෙනසක් සඳහා කැපකිරීම් කිරීමට ඇති කැමැත්ත***




රට පාලනය කරන ආකාරයේ වෙනසක් සඳහා පුරවැසියන් කෙතරම් සහාය දක්වන්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා අ) තමන්ගේ සුපුරුදු වූ ගමන් බිමන් හා ප්‍රවාහනය වෙනස් කිරීම, ආ) මිලදී ගැනීමට හුරුවී සිටි ආහාර ද්‍රව්‍ය වෙනස් කිරීම, ඇ) වැඩිපුර බදු ගෙවීම, ඈ) ප්‍රතිචාරකයාට හෝ ඔහුගේ/ඇයගේ පවුලේ සාමාජිකයෙකුට රැකියාවක් අහිමි වීම වැනි කැපකිරීම් කිරීමට සිදුවුවහොත් තවදුරටත් පාලනය කරන විදියේ වෙනසකට එකඟ වෙනවාද එකඟ නොවෙනවාද යන්න ප්‍රතිචාරකයන්ගෙන් විමසන ලදී. සමීක්ෂණයේ සොයාගැනීම්වලින් හෙළි වන්නේ කැපකිරීම් දැඩි වන විට පාලන ක්‍රමයේ වෙනසක් සඳහා වන සහය අඩු වන බවයි. නිදසුනක් වශයෙන්, සැලකිය යුතු ප්‍රතිශතයක් (76%) තම සුපුරුදු ගමන් බිමන් හෝ ප්‍රවාහන ක්‍රමයක කැපකිරීමක් කිරීමට සිදුවුවත්, පාලන වෙනසක් සඳහා සහය දැක්වීමට එකඟතාව ප්‍රකාශ කරයි. තව ද 70% කට ආසන්න ප්‍රමාණයක් ප්‍රකාශ කරන්නේ ඔවුන් මිලදී ගැනීමට පුරුදු වූ ආහාර ද්‍රව්‍ය කැපකිරීමට සිදුවුවත් පාලනය වන විදියේ වෙනසකට එකඟ බවයි. ඔවුන් වැඩිපුර බදු ගෙවන්නේ නම් (41%) මෙම සහය විශාල ලෙස අඩු වේ. ප්‍රතිචාරකයාට හෝ ඔහුගේ/ඇයගේ පවුලේ කිසිවකුට රැකියාවක් අහිමි වුවහොත් පවා පාලන ක්‍රම වෙනස් කිරීමකට සහාය දීමට තවමත් එකඟ වන්නේ ශ්‍රී ලාංකිකයන්ගෙන් හතරෙන් එකකට (26%) ආසන්න ප්‍රමාණයකි. මෙහි විශේෂත්වය නම්, මෙම ආකල්පය ප්‍රතිචාරකයන්ගේ වයස අනුව වෙනස් නොවීයි.

### *සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රයන් පෞද්ගලීකරණය කිරීම පිළිබඳ මතය*




වත්මන් ආර්ථික ප්‍රතිසංස්කරණ කතිකාව යටතේ පෞද්ගලීකරණය සියල්ලටම විසඳුම ලෙස ඉදිරිපත් කර ඇති බව පෙනේ. වත්මන් වික්‍රමසිංහ ආණ්ඩුව රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කිරීම සඳහා විවෘතව පෙනී සිටින්නේ, පෙනෙන පරිදි රජයේ වියදම් කපා හැරීම සඳහා ය. වත්මන් වික්‍රමසිංහ ආණ්ඩුව රාජ්‍ය වියදම් කපා හැරීම සඳහා යැයි හුවා දක්වමින් පෞද්ගලීකරණය කිරීමට විවෘතව පෙනී සිටියි. සෞඛ්‍ය සහ අධ්‍යාපනය යන ඉතා වැදගත් අංශ දෙක පෞද්ගලීකරණය කිරීම සම්බන්ධයෙන් මහජන එකඟතාව/ එකඟ නොවීම මෙම සමීක්ෂණය මඟින් විමසා බලන ලදී. සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා එය පෞද්ගලීකරණය කිරීමේ යෝජනාවට එකඟ වන්නේ ශ්‍රී ලාංකිකයන්ගෙන් සුළු ප්‍රතිශතයක් (27% සහ 24%) පමණක් බව සමීක්ෂණ ප්‍රතිඵල පෙන්වා දෙයි. එහිදී ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට වඩා වැඩි පිරිසක් තම එකඟ නොවීම ප්‍රකාශ කිරීම කැපී පෙනේ. මෙම ක්ෂේත්‍ර දෙක පෞද්ගලීකරණය කිරීම පිළිබඳ තරුණ සහ වැඩිහිටි පිරිස් අතර ප්‍රබල භේදයක් නොමැති වුව ද පෞද්ගලීකරණය සඳහා තරුණ පිරිස් අතර තරමක ඉහළ සහයක් පවතී.

### *ආර්ථිකය පෞද්ගලීකරණය කිරීම පිළිබඳ මතය*




වත්මන් ආර්ථික අර්බුදයේ පසුබිම තුළ නව ප්‍රබෝධයක් ලබා ඇති නව ලිබරල්වාදී ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන්ගේ ආකල්ප පෙන්නුම් කරන කරුණු පිළිබඳ මහජන මතය සමීක්ෂණයහි තවදුරටත් විමර්ශනය කරයි. සොයාගැනීම්වලින් පෙනී යන්නේ පුරවැසියන්ගෙන් බහුතරයක් විදේශ රටවලට, රට තුළ ආයෝජනය කිරීමට ඉඩ දීම (60%) සහ පුද්ගලයෙකුගේ ඉපැයීමේ හැකියාව සීමා නොකිරීම (63%) වැනි ප්‍රතිපත්තිවලට සහාය දෙන බවයි. කෙසේ වෙතත්, සොයාගැනීම්වලට අනුකූලව, රාජ්‍ය අංශය හැකිලීමට මිනිසුන් එකඟ නොවේ. නිදසුනක් වශයෙන්, ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට වඩා (52%) ප්‍රකාශ කරන්නේ රටේ සංවර්ධනයට අවශ්‍ය බැවින් රජයේ සංස්ථා පෞද්ගලීකරණය නොකළ යුතු බවයි.

***නව ලිබරල්වාදී ආර්ථිකය යටතේ රජයේ කාර්යභාරය***




වත්මන් ආර්ථික ප්‍රතිසංස්කරණ කතිකාව යටතේ, නව ලිබරල්වාදීන් රජයේ සේවකයන් අඩු කිරීම, සුබසාධන වියදම් කපා හැරීම සහ රැකියා සැපයීමේ වගකීමෙන් රජය නිදහස් කිරීම වෙනුවෙන් පෙනී සිටිති. අධ්‍යයනයට අනුව, වැඩි පිරිසක් නව ලිබරල් තාර්කිකත්වය පිළිබඳව විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ රැකියා සම්බන්ධයෙන් සහ රැකියා සපයන්නෙකු ලෙස රජය වගකීම භාර ගැනීම සම්බන්ධයෙන් වන කරුණුවලට එකඟත්වය ප්‍රකාශ කරයි. කෙසේ වෙතත්, ජනතාවගෙන් අඩක් පමණ විශ්වාස කරන්නේ ජනතාව රැකබලා ගැනීම රජයේ වගකීමක් වන අතර රජය සුබසාධන වැඩසටහන් සඳහා වියදම් කළ යුතු බවයි. පොදුවේ ගත් කල, නව ලිබරල්වාදී යෝජනා පිළිබඳව ශ්‍රී ලාංකික තරුණයින් (වයස අවුරුදු 30 ට අඩු) තරමක් වැඩියෙන් එකඟත්වය ප්‍රකාශ කර තිබේ.

**අවසානය.**

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමගින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවැති රික්තකයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටළු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.